# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
# கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
# Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


මගේ අංකය / எனது இல / My No. } SP/CEC/1/0/5 ඔබේ අංකය / உனது இல / Your No. } දිනය / திகதி / Date } 2024.01.26

චක්‍රලේඛ අංක : 03/2024

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

<u>කුලවද්දාගත් දරුවෙකු හදාවඩා ගැනීම වෙනුවෙන් නිවාඩු ලබාදීම.</u>

උක්ත කරුණට අදාලව පහත සඳහන් පොදු විධිවිධාන හා උපදෙස් ලබා දීමට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. දරුවෙකු හදාවඩා ගැනීම විශේෂ අවස්ථාවක් සේ සලකා පහත සඳහන් විධිවිධාන වලට යටත්ව සමූපකාර සේවිකාවකට උපරිම මාස 04ක් අඛණ්ඩව නිවාඩු ලබා දීමට පුළුවන.

2.1 අදාල වර්ෂයේ සේවිකාවට හිමි සම්පූර්ණ නිවාඩු,
2.2 අනුගාමී වර්ෂ 02ක ඉතිරි විවේක නිවාඩු,
2.3 මාස02 නොඉක්මවන පරිදි අඩ වැටුප් නිවාඩු,
2.4 මාස ½ නොඉක්මවන පරිදි වැටුප් රහිත නිවාඩු,

03. ඒ අනුව, කුලවද්දාගත් දරුවෙකු හදාවඩා ගැනීම වෙනුවෙන් සමූපකාර සේවිකාවකට නිවාඩු ලබා දීමේ දී පහත පරිදි කටයුතු කල යුතු වේ.

03.1 හදාවඩා ගැනීම සඳහා ලබා ගන්නා දරුවාගේ වයස මාස 10 කට අඩු විය යුතු අතර, එම දරුවාගේඋප්පැන්න සහතිකයේ සත්‍ය පිටපතක් ඉදිරිපත් කල යුතු ය.

03.2 දරුවා නීත්‍යානුකූලව ලබා ගෙන තිබීම හෝ දරුවා නීත්‍යානුකූලව ලබා ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ගයකට එළඹ ඇති බව සනාථ කල යුතු ය.

03.3 මෙම නිවාඩුව, දරුවාගේ නීතිමය භාරකාරීත්වය සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ නඩු කටයුත්තක් ආරම්භ කරන ලද දින සිට හෝ දරුවාගේ නීත්‍යානුකූල භාරකාරීත්වය සම්බන්ධයෙන් අධිකරණයෙන් අතුරු නියෝගයක් ලබා දුන් දින සිට හෝ දරුවා කුලවද්දා ගැනීම සම්බන්ධයෙන් පවරන ලද නඩුවේ තීන්දුව ලබා දුන් දින සිට හෝ ආරම්භ කළ යුතු අතර, දරුවාගේ උපතේ සිට මාස 10ක් ගත වීමට පෙර ආරම්භ විය යුතුය. කෙසේවුව ද, පෙර කී අවශ්‍යතා සම්පූර්ණ කරන දිනය දරුවාගේ උපතේ සිට මාස 10කට පසුව එළඹෙන දිනයක් වුවහොත් මෙම විධිවිධාන අනුව නිවාඩු ලබා ගැනීමට හිමිකමක් නැත.

03.4 වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට පෙර නිලධාරිනිය විසින් ලබා ගෙන ඇති ණය හෝ අත්තිකාරමක, මාසික වාරික නොකඩවා ගෙවීම සඳහා සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට සේවිකාව වග බලා ගත යුතු අතර, එය නිසි පරිදි සිදුවන බවට දෙපාර්තමේන්තුව ප්‍රධානියා තහවුරු කර ගත යුතු ය.

03.5 යම් හෙයකින් නිවාඩු අනුමත කිරීමෙන් පසු දරුවා මිය ගියහොත් එයින් දින 07කට පසු මෙම නිවාඩුව අවලංගු වේ.

03.6 මේ යටතේ ලබා දෙන නිවාඩු වැටුප් වර්ධක කාර්යයන් සඳහා ද විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා ද බාධාවක් නොවිය යුතු ය. එම කාලය තුළ ඇතිවන පුරප්පාඩුවල දී ද, උසස්වීම් ලබා දීම සඳහාද එම නිවාඩු කාලය සක්‍රිය සේවා කාලයක් සේ සැලකිය යුතු ය.


ලේකම් / செயலாளர் / Secretary } 091-2232794
පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk

04. සමූපකාර ක්ෂේත්‍රයේ ස්ථිර සේවකයෙකු සඳහා කුලවද්දාගත් දරුවෙකු හදාවඩා ගැනීම වෙනුවෙන් වැඩ කරන දින 03 ක විශේෂ පීතෘත්ව නිවාඩුවක් ලබා ගැනීමට හිමිකම ඇති අතර එය , දරුවා කුලවද්දාගත් දින සිට මාස 03ක් ඇතුළත ලබා ගත යුතු ය. මෙම නිවාඩුව ලබා ගැනීම සඳහා කුලවද්දා ගන්නා දරුවා මාස 10කට අඩුවිය යුතු ය. එමෙන්ම, අදාළ සේවකයා විසින් තම විවාහ සහතිකය, දරුවාගේ උප්පැන්න සහතිකය හා දරුවා කුලවද්දා ගැනීමට පවරන ලද නඩුවේ තීන්දුව ඉදිරිපත් කර විශේෂ නිවාඩුවේ හිමිකම සනාථ කර ගත යුතු ය.

05. මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී සිදු කරන සංශෝධනයන්ට යටත්ව ඉහත නියෝගය අනුව කටයුතු කරන මෙන් කොමිෂන් සභා තීරණය පරිදි දන්වා සිටිමි.

06. මෙම චක්‍රලේඛ විධිවිධාන 2023.12.01 දින සිට ක්‍රියාත්මක වේ.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජයන්ත ජී. ලියනගේ
ලේකම් (වැ.බ.)
සමූපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

ජයන්ත ජී.ලියනගේ.
ලේකම්(වැ.බ.),
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත :- 01. ලේකම් - කෘෂිකර්ම ගොවිජන සංවර්ධන....සමූපකාර අමාත්‍යාංශය(ද.ප)- දැ.ස.
02. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප) -කරු.ස.සං.ප්‍රා.නි.
හරහා අදාල සමිති
දැනුවත්කිරීම සඳහා

03. දිවයිනේ සියලුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ස.
04. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුව - දැ.ස.